මගේ අංකය
எனது இல
My Number
ME/E/04-I/06/04/මා.ම. 2022/23

PMoE Sabaragamuwa

සබරගමුව පළාත් සභාව - சப்ரகமுவ மாகாண சபை - Sabaragamuwa Provincial Council

ඔබේ අංකය
உமது இல
Your Number

අධ්‍යාපන, තොරතුරු තාක්ෂණ හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය
கல்வி தகவல் தொழில் நுட்பம் மற்றும் கலாச்சார நடவடிக்கைகளுக்கான அமைச்சு
Ministry of Education, Information Technology & Cultural Affairs
Email – edusabaram@gmail.com www.moe.sg.gov.lk

දිනය
திகதி
Date
2022.06.20

අමාත්‍යාංශ ලේකම්
Secretary
Office – 045 2223015

කාර්යාලය
Office
නවනගරය,රත්නපුර.
Newtown, Rathnapura.
Office - 045 2222542 Fax - 045 2228042

පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ, සබරගමුව පළාත,
අතිරේක පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ, පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව,
සබරගමුව පළාතේ සියළුම කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,
සබරගමුව පළාත් පාසල්වල සියළුම විදුහල්පතිවරුන්,
සබරගමුව පළාත් පාසල්වල සියළුම ගුරුභවතුන්,

**වාර්ෂික ගුරු ස්ථාන මාරුවීම් සඳහා අයදුම්පත් කැඳවීම - 2022/23.**

සබරගමුව පළාතේ පළාත් සභා පාසල්වල සේවය කරන ගුරුභවතුන්ගේ වාර්ෂික ගුරු ස්ථාන මාරුවීම් (අධ්‍යාපන කලාප තුල/අන්තර් කලාප/අන්තර් පළාත් සහ ජාතික පාසල්) සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.

මේ යටතේ සබරගමුව පළාත් සභාවට අයත් පාසල්වල 2022.12.31 දිනට සේවා කාලය වසර 05ක් සම්පූර්ණ කල සෑම ගුරුභවතෙකුම ස්ථාන මාරු අයදුම්කල යුතු අතර, එසේ අයදුම්පත් ඉදිරිපත් නොකලහොත් සබරගමුව පළාතේ ඕනෑම ස්ථානයකට ස්ථාන මාරු ලැබීමට කැමති සේ සලකා ක්‍රියා කිරීමට සිදුවනු ඇත.

අධ්‍යාපන කලාප තුල සහ අන්තර් කලාප ගුරු ස්ථාන මාරුවීම් 2023.01.01 දින සිට ක්‍රියාත්මක කිරීමට නියමිත වේ.

එසේම මෙවර වාර්ෂික ගුරු ස්ථාන මාරුවීම් සඳහා අයදුම්පත් කැඳවීම **සිප්තතු දත්ත පද්ධතිය හරහා මාර්ගගත ක්‍රමය (Online) ඔස්සේ පමණක් සිදුකරනු** ලබන බැවින් ස්ථාන මාරු අපේක්ෂා කරන සෑම ගුරුභවතෙකුම ඒ සම්බන්ධයෙන් පහත ලබාදී ඇති උපදෙස්වලට අනුකූලවම පමණක් අයදුම්කල යුතුය. මාර්ගගත ක්‍රමය (Online) යටතේ සකස් කර ඇති අයදුම්පත්‍රය හැර වෙනත් කිසිදු ගුරු ස්ථානමාරු අයදුම්පත් ආකෘතියක් අයදුම් කිරීම සඳහා භාවිතා නොකල යුතු අතර, කිසියම් හෝ අයෙකු වෙළඳපලේ ඇති වෙනත් මුද්‍රිත ස්ථානමාරු අයදුම්පත්‍රයක් භාවිතා කලහොත් එම අයදුම්පත්‍රය ඉදිරි කටයුතු සඳහා භාවිතයට නොගන්නා බවද සැලකිය යුතුය.

උපදෙස් :-

i. වාර්ෂික ගුරු ස්ථාන මාරුවීම් සඳහා අයදුම්කරනු ලබන සෑම ගුරුභවතෙකුම ඒ සඳහා **"www.semis.lk"** යන වෙබ් අඩවිය භාවිතා කල යුතුය.
ii. මෙහිදී එක් එක් ගුරුභවතා වෙබ් අඩවිය භාවිතා කිරීමට පරිශීලක නම (User Name) ලෙස සිය ජාතික හැඳුනුම්පත් අංකය ඇතුලත් කල යුතුය. එහි මුරපදය (Password) ලෙස සිය ජාතික හැඳුනුම්පත් අංකයේ මුල් ඉලක්කම් 06 ඇතුලත් කල යුතුය. එසේ නැතහොත් මුරපදය (Password) ලෙස 123456 ඇතුලත් කල යුතුය. එසේත් ඇතුලත් විය නොහැකි නම් සිය විදුහල්පතිවරයා මගින් මුරපදය (Password) වෙනස් කරගත යුතුය.
iii. එසේ ඇතුලත්වූ (Logging) පසු **MY PROFILE** හා **TRANSFER** යන කවුළු 02ක් දැකිය හැක. එහි පළමු කවුළුව වන **MY PROFILE** කවුළුවට ඇතුල් වීමෙන් ගුරුභවතාට සිය පෞද්ගලික දත්ත පරීක්ෂා කල හැකිය. එහිදී සිය පෞද්ගලික දත්ත නිවැරදි නොවන අවස්ථාවක් ඇත්නම් එය නිවැරදි කරගත යුතුය.

iv. **MY PROFILE**හි ඇති පෞද්ගලික දත්ත නිවැරදි නම් ඉන් අනතුරුව ස්ථාන මාරුවීම් සඳහා අයදුම්කල හැකිය. ඒ සඳහා **APPLY FOR TRANSFER** යන කවුළුව භාවිත කරන්න. එහි **APPLICATION STATUS** සහ **APPLY** යන කවුළු 02ක් ඇත. එහි **APPLY** කවුළුවට පිවිස ස්ථාන මාරුවීම සඳහා අයදුම්කල හැකිය.

v. කිසියම් ගුරුභවතෙකු අධ්‍යාපන කලාපය තුළ ස්ථාන මාරුවීමක්, අන්තර් කලාප ස්ථාන මාරුවීමක්, අන්තර් පළාත් ස්ථාන මාරුවීමක් හෝ ජාතික පාසල් ස්ථාන මාරුවීමක් යන අවස්ථා 04 සඳහාම අයදුම් කිරීමට අපේක්ෂා කරන්නේ නම් ඒ සඳහා වෙන් වෙන් වශයෙන් අයදුම් කල යුතුය.

vi. අයදුම්කර අවසානයේ **APPLICATION STATUS** කවුළුවට පිවිසිය යුතුය. එහිදී ගුරුභවතාහට සිය අයදුම්පත්‍රයේ වර්තමාන තත්වය පරීක්ෂා කල හැකි අතර, එහිදී සිය අයදුම්පත්‍රය අයදුම් කරන ලද කාණ්ඩ අනුව PDF ලෙස බාගත (Download) කරගත හැක. ගුරුභවතා විසින් එසේ බාගත කරගන්නා ලද අයදුම්පත්‍රවල පිටපත් මතු අවශ්‍යතාව සඳහා **තමා සන්තකයේ පමණක්** තබාගත හැකි අතර, **එම පිටපත් කළාප අධ්‍යාපන කාර්යාලය වෙත හෝ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව වෙත හෝ පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය වෙත හෝ තැපැල් මාර්ගයෙන් යොමු කිරීම හෝ පැමිණ භාරදීම නොකල යුතුය.**

vii. විදුහල්පතිවරුන් සිය **PROFILE** එක තුලින් ඇතුල් (Log)වී එහි ඇති **TRANSFER** කවුළුවට පිවිස එතෙක් ලැබී ඇති අයදුම්පත් එකින් එක පරීක්ෂා කර බලා නිවැරදි නම් සුදුසු පරිදි නිර්දේශ කල යුතුය.

viii. කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් සිය **PROFILE** එක තුලින් ඇතුල් (Log)වී එහි ඇති **TRANSFER** කවුළුවට පිවිස එතෙක් ලැබී ඇති අයදුම්පත් එකින් එක පරීක්ෂා කර බලා නිවැරදි නම් සුදුසු පරිදි නිර්දේශ කල යුතුය. **මෙහිදී අධ්‍යාපන කලාප තුල ස්ථානමාරු සඳහා මාරු මණ්ඩල පවත්වන අවස්ථාවේදී යොමුකර ඇති අයදුම්පත් මුද්‍රණය කිරීමකින් (පවතින මුද්‍රණ කඩදාසි හිඟය විශේෂයෙන් සැලකිල්ලට ගෙන) තොරව සිප්තතු දත්ත පද්ධතිය හරහා පමණක් මාරු මණ්ඩල තීරණ වලට එළඹීමට කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් කටයුතු කල යුතුය.**

ix. පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ සිය **PROFILE** එක තුලින් ඇතුල් (Log) වී එහි ඇති **TRANSFER** කවුළුවට පිවිස එතෙක් ලැබී ඇති අයදුම්පත් එකින් එක පරීක්ෂා කර බලා නිවැරදි නම් සුදුසු පරිදි නිර්දේශ කල යුතුය.

x. ඉහත දක්වා ඇති පරිදි කටයුතු කිරීමේදී කිසියම් තාක්ෂණික ගැටළුවක් ඇතිවුවහොත් පමණක් පහත දුරකථන අංක අමතන්න.

0718111513 - සහකාර අධ්‍යක්ෂ අන්සෆ් මහතා
0704001966 - Whatsapp
0722355681 - Whatsapp

<u>මාර්ගගත ක්‍රමය (Online) යටතේ ස්ථානමාරු අයදුම්පත් යොමුකල යුතු අනිවාර්යය කාලසීමාවන් :-</u>

i. ගුරුභවතුන්ගේ අයදුම්පත් අදාල විදුහල්පතිවරුන් වෙත 2022.08.01 (2022.07.11 දින සිට 2022.07.31 දින දක්වා) දිනට ප්‍රථම යොමුකල යුතුය.

ii. විදුහල්පතිවරුන්ගේ නිර්දේශ සහිත එකී අයදුම්පත් කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් වෙත 2022.08.15 (2022.07.11 දින සිට 2022.08.14 දින දක්වා) දිනට ප්‍රථම යොමුකල යුතුය.

iii. කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්ගේ නිර්දේශ සහිත එකී අයදුම්පත් කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් විසින් 2022.09.01 (2022.08.15 දින සිට 2022.08.31 දින දක්වා) දිනට ප්‍රථම පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත යොමුකල යුතුය.

iv. පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් නිර්දේශ කරන ලද එකී අයදුම්පත් 2022.09.15 (2022.09.01. දින සිට 2022.09.14 දින දක්වා) දිනට ප්‍රථම පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය වෙත යොමුකල යුතුය.

<u>වෙනත් විශේෂ කරුණු :-</u>

i. වාර්ෂික ගුරු ස්ථාන මාරු 2021/22 යටතේ අයදුම්කර, එහෙත් මෙතෙක් සුදුසු අනුප්‍රාප්තිකයෙකු නොලැබීම හේතුවෙන් ස්ථාන මාරුවීම් ක්‍රියාත්මක නොවූ ගුරුභවතුන් 2022/23 වර්ෂය සඳහා ද නැවත අයදුම් කිරීම අනිවාර්යය වේ.

ii. මාර්ගගත ක්‍රමය ඔස්සේ ස්ථානමාරු අයදුම්පත ඉදිරිපත් කිරීමේදී අදාල සියලු තොරතුරු නිවැරදිව ඇතුලත් කිරීම ගුරුභවතා සතු වගකීමකි. එසේ නිවැරදි තොරතුරු ඇතුලත් නොකල සහ අසම්පූර්ණ අයදුම්පත් සම්බන්ධයෙන් ගුරු මාරු මණ්ඩලය විසින් ගනු ලබන ඕනෑම තීරණයකට ගුරුභවතා යටත් වන්නේය.

iii. 2022.09.30 දිනෙන් පසු අන්තර් කලාප, අන්තර් පළාත් සහ ජාතික පාසල් ස්ථානමාරුවීම් වලට අදාල මාරු මණ්ඩල රැස්වීමට නියමිත බැවින් ඊට ප්‍රථම අධ්‍යාපන කලාප තුල ස්ථානමාරුවීම් වලට අදාල මාරු මණ්ඩල තීරණ ලබාදී අවසන් කිරීම කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් සතු වගකීමකි. (එනම් අන්තර් කලාප, අන්තර් පළාත් හා ජාතික පාසල් ගුරු මාරු මණ්ඩල තීරණ ගැනීමට බාධාවක් නොවන පරිදි අධ්‍යාපන කලාප තුල මාරු මණ්ඩලවල කටයුතු 2022.09.30 දිනට ප්‍රථම අවසන් කල යුතුය).

iv. සියළුම ගුරු මාරුවීම් වලට අදාල මාරු මණ්ඩල තීරණ සිප්තතු දත්ත පද්ධතිය හරහා පමණක් ගුරුභවතුන් වෙත නිවේදනය කරනු ඇත.

v. අන්තර් පළාත් සහ ජාතික පාසල් ස්ථාන මාරුවීම් යටතේ ගනු ලබන්නාවූ මාරු මණ්ඩල තීරණවලට අදාලව සුදුසුකම්ලත් අයදුම්පත් සඳහා ඉදිරි කටයුතු කිරීමට අවශ්‍ය වන ලිපි ලේඛන (පිරික්සුම් ලැයිස්තු ආදිය) පිළිබඳව ද සිප්තතු දත්ත පද්ධතිය හරහා පමණක් ගුරුභවතුන් වෙත නිවේදනය කරනු ලබන අතර, එම නිවේදනයන්ට අනුකූලව අවශ්‍ය ලිපි ලේඛන අප්‍රමාදව සැපයීම ගුරුභවතුන් සතු වගකීමකි. ඒ සම්බන්ධයෙන් පසුව කරනු ලබන ඉල්ලීම්, අභියාචනා සැලකිල්ලට ගනු නොලැබේ.

<u>සැලකිය යුතුයි :-</u>

වාර්ෂික ගුරු ස්ථාන මාරු 2022/23 යටතේ අයදුම්පත් කැඳවනු ලබන් 2022.07.11 දින සිට ස්ථාන මාරු ක්‍රියාවලිය අවසන් වන දිනය තෙක් වාර්ෂික ස්ථානමාරු නොවන අභ්‍යන්තර ස්ථාන මාරුවීම් සිදුනොකිරීමට කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් වගබලා ගතයුතු අතර, එවැනි ඉල්ලීම් හෝ අභියාචනා ඉදිරිපත් නොකිරීම ද ගුරුභවතුන් සතු අනිවාර්ය වගකීමකි. එසේ ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් හෝ අභියාචනා සම්බන්ධයෙන් කටයුතු නොකරන බව ද අවධාරණය කරමි.

මේ සඳහා ඔබගෙන් ලැබෙන සහයෝගය අගය කරමි.

සුජානි ආර්. විජේතුංග
ලේකම්
අධ්‍යාපන තොරතුරු තාක්ෂණ සහ
සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය
සබරගමුව පළාත් සභාව
නව නගරය - රත්නපුර

S. Ra...

**සුජානි ආර්. විජේතුංග,**
අධ්‍යාපන, තොරතුරු තාක්ෂණ හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය,
සබරගමුව පළාත.

පිටපත් :-

1. ප්‍රධාන ලේකම්, සබරගමුව පළාත. - කාරුණික දැ.ගැ.ස.
2. ආණ්ඩුකාර ලේකම්, සබරගමුව පළාත. - ගරු ආණ්ඩුකාරතුමා දැනුවත් කිරීම සඳහා.
3. සියළුම කොට්ඨාස අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් - ඔබ කොට්ඨාසයේ විදුහල්පතිවරුන් මගින් සියළුම ගුරුභවතුන්අනිවාර්යයෙන් දැනුවත් කිරීම සඳහා.